සැ. යු.- (i) 2010.07.02 වැනි දින පළ වූ අංක 1,661 දරන *ගැසට් පත්‍රයේ* III කොටස පළ නොවීය.
(ii) මෙම *ගැසට් පත්‍රයේ* දෙමළ අනුවාදය වෙනම මුද්‍රණය කෙරේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 1,662 - 2010 ජූලි මස 09 වැනි සිකුරාදා - 2010.07.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 1302 |
| පළාත් සභා විවිධ දැන්වීම් ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | 1310 |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |


**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 ජූලි මස 16 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 ජූලි මස 02 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# පළාත් සභා නිවේදන

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාතේ පළාත් සභාව**

ඌව පළාතේ පළාත් සභාවේ 2010 අංක ........................ දරන කෘෂිකර්ම සංවර්ධන ප්‍රඥප්ති කෙටුම්පත

මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවීමෙන් දින 10 ක් ඉක්ම ගිය පසු ඌව පළාතේ පළාත් සභාවට ඉදිරිපත් කරන බව දන්වා සිටිනු ලැබේ. මෙම ප්‍රඥප්තියේ අඩංගු කරුණු සම්බන්ධයෙන් යම්කිසි කරුණක් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන්නේ නම් මෙම දැන්වීමෙන් දින 10ක් තුළ දී එකී කරුණු මා වෙත දැනුම් දිය යුතුය.

අනුර රවීන්ද්‍ර විදානගමගේ,
ඌව පළාතේ කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන,
සත්ත්ව නිෂ්පාදන, මිරිදිය ධීවර, පරිසර හා
සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍ය.

**ඌව පළාතේ පළාත් සභාව**

***2010 අංක ................... දරන ඌව පළාත් කෘෂිකර්ම සංවර්ධන ප්‍රඥප්තිය***

***ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනයේ 9 වැනි උපලේඛනයේ 1 වැනි ලැයිස්තුවේ අංක 09 පරිදි පවරන ලද බලතල ක්‍රියාත්මක කිරීම සඳහා ඌව පළාතේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවක් පිහිටුවීම හා ඒ සම්බන්ධයෙන් වන අනුෂාංගික කරුණු විධිවිධාන සැලැස්වීම පිණිස වන ප්‍රඥප්තියයි***

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය

1. මෙම ප්‍රඥප්තිය වර්ෂ 2008 අංක ........................... දරන ඌව පළාත් කෘෂිකර්ම සංවර්ධන ප්‍රඥප්තිය ලෙස හඳුන්වනු ලබන අතර ඌව පළාත් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලබන දින සිට හෝ නියම කරන පසු දිනක සිට හෝ ක්‍රියාත්මක වන්නේ ය.

අරමුණ

2. නව කෘෂිකාර්මික තාක්ෂණික ක්‍රම උපයෝගී කර ගනිමින් හා ප්‍රචාරණ කටයුතු තුළින් පළාතේ කෘෂිකාර්මික සංවර්ධනය ඉහළ තලයකට ගෙන ඒම සඳහාත් ගොවි ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කරලීමත් පදනම් වූ පුළුල් වැඩසටහනක් සංවිධානය කිරීම හා පවත්වාගෙන යාමට අවශ්‍ය ප්‍රතිපාදන සැලැස්වීම මේ ප්‍රඥප්තියේ අරමුණ වන්නේ ය.

කාර්යාල පද්ධතියක් පිහිටුවීම

3. මෙම ප්‍රඥප්තියේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහාත්, ඒවා ක්‍රියාත්මක කිරීම සඳහාත් පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවත්, දිස්ත්‍රික් කාර්යාල, කළාප කාර්යාල හා ප්‍රාදේශීය කාර්යාල පද්ධතියක් ස්ථාපනය කරනු ඇත.

කාර්ය මණ්ඩලය

4. කෘෂිකාර්මික ව්‍යාප්තිය, ප්‍රවර්ධනය හා කෘෂිකාර්මික සේවා ප්‍රශස්ථ මට්ටමින් පළාත තුළ පවත්වාගෙන යාම සඳහා මෙතෙක් පළාත තුළ සේවයේ යෙදුන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් සියලුම සේවාවල කාර්ය මණ්ඩල ඔවුන්ගේ මනාපය පළ කිරීමට යටත්ව පළාත් රාජ්‍ය සේවයේ සාමාජිකයින් ලෙස හඳුනාගත යුතු ය.

5. ඉහත 3 වැනි වගන්තිය ප්‍රකාරව සංවිධානය කරනු ලබන කාර්යාල පද්ධතියට අවශ්‍ය මානව සම්පත් 4 වැනි වගන්තියේ සඳහන් නිලධාරීන්ගෙන් සලසා ගත යුතු වේ. එකී නිලධාරීන් ඌව පළාත් ආණ්ඩුකාරවරයා විසින් හෝ අදාළ බලධාරීන් විසින් හෝ ඒ ඒ තනතුරුවලට පත් කරනු ඇත.

කෘෂිකාර්මික ව්‍යාප්තිය

6.1 *(අ)* සම්ප්‍රදායික දේශීය භෝගවලට මෙන්ම අළුතින් හඳුන්වාදී ඇති භෝග සඳහා ප්‍රශස්ථ කළාප හඳුනා ගැනීමත් ඒ අනුව අදාළ භෝග වගාවන් ප්‍රචලිත කිරීම හා ඉලක්ක කරගත් ක්ෂේත්‍ර ව්‍යාප්ති කටයුතු සංවිධානය කර ක්‍රියාත්මක කිරීම.

*(ආ)* නව ආර්ථික භෝගවල ඵලදායිතාව වැඩි කිරීමේ උපාය මාර්ග ඉවහල් කර ගනිමින් පළාත තුළ ආදර්ශ වගාවන් පවත්වාගෙන යාම මගින් ගොවි ජනතාව එම උපාය මාර්ග වැළඳ ගැනීමට පෙළඹවීමත්, එතුළින් පවුල් ඒකකයන්හි ආදායම ඉහළ තලයකට ගෙන යාම.

*(ඇ)* වගාබිම් ක්ෂේත්‍රය පුළුල් කිරීමට වඩා තිබෙන වපසරිය උපයෝගී කර ගනිමින් ආදායම් වැඩි කර ගැනීමේ අවශ්‍යතාවයක වැදගත්කම සම්බන්ධයෙන් ගොවියා දැනුවත් කිරීම හා එමගින් ඇති වන ආර්ථික වාසි පිළිබඳ අවබෝධය ලබා දීම.

*(ඈ)* ජාතික කෘෂිකාර්මික නිෂ්පාදනයේ ඌව සලාකය පැහැදිලිව හඳුනාගෙන එම නිෂ්පාදන ධාරිතාව ඉලක්ක කරගත් ව්‍යාප්ති වැඩසටහනක් දීර්ඝ කාලීනව තිරසාර අන්දමින් ක්‍රියාත්මක කිරීම.

*(ඉ)* කෘෂිකර්මයට අදාළව වපසරිය, බෝග, වාර්ෂික හා වගා කන්නයන් අනුව නිෂ්පාදනය, බලාපොරොත්තු, ඉලක්ක සම්බන්ධයෙන් වන තොරතුරු පරිගණක දත්ත පද්ධතියක් පිහිටුවීම හා එය යාවත්කාලීනව පවත්වාගෙන යාම.

(ඊ) සුළු ගොවි කණ්ඩායම් සංවිධානය කිරීම තුළින් කෘෂි ව්‍යාප්ත කටයුතු ක්‍රමවත් කිරීම.

කෘෂිකාර්මික ප්‍රවර්ධනය

6.2 *(අ)* කෘෂිකර්ම ක්ෂේත්‍රයේ උන්නතිය පිණිස නිරන්තරයෙන් හඳුන්වා දෙන නව තාක්ෂණ හා ක්‍රමවේදයන් පළාත තුලට කඩිනමින් ගෙන ඒමට සැලැස්වීමෙන් හා එම ක්‍රමවේදයන් ගොවි ජනතාවට මනාසේ උකහා ගැනීමට අවස්ථාව සලසාදීම තුළින්, ඒවායෙන් ලැබෙන ප්‍රතිලාභ ගැන දැනුවත්වීමට ඉඩකඩ සැලසීම.

*(ආ)* ඉහළ ඉල්ලුමක් හා වැඩි ආර්ථික ලාභයක් ඇති නව භෝග විශේෂ හඳුන්වාදීමේ පුළුල් වැඩසටහන් සඳහා දෙපාර්තමේන්තු ආශ්‍රිත වැඩ සටහන්වල ප්‍රමුඛත්වයක් ලබා දීම.

*(ඇ)* රසායනික පොහොර සහ කෘමිනාශක භාවිතය විධිමත් කිරීමටත් ඒ වෙනුවට කාබනික පොහොර හා දේශීය කෘමි පාලන ක්‍රම භාවිතය ප්‍රචලිත කිරීමටත් යාය ආදර්ශන සංඛ්‍යාව පුළුල් කරමින් එම ක්ෂේත්‍රවලට ඇති ඉල්ලුම පුළුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

*(ඉ)* නව වර්ග හා ප්‍රභේදවලට අයත් ගුණාත්මක බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය, ආනයනය කර බෙදාහැරීම හා සේවා පහසුකම් සුලභ කිරීම.

*(ඊ)* භෝග බාණ්ඩ ලෙස (Block) වගා ක්ෂේත්‍ර පිහිටුවීම.

*(උ)* පටක රෝපණය වැනි නව තාක්ෂණ ක්‍රම මගින් දියුණු කරන ලද කාර්යයන් ගොවි ජනතාවට සුලභව හා පහසුව ලබා ගැනීමට අවස්ථාව සැලසීම.

*(ඌ)* කෘෂිපාදක කර්මාන්ත හඳුන්වාදීම හා එම නිෂ්පාදන වෙළඳ පොලට ඉදිරිපත් කිරීම.

*(එ)* ගෙවතු වගා සංවර්ධනයට අදාළ මී මැසි පාලනය, ව්‍යාපාරික මල් වගාව ප්‍රචලිත කිරීමට දායක වීම.

කෘෂිකාර්මික අධ්‍යාපනය හා පර්යේෂණය

6.3 *(අ)* සැලසුම් සහගත ඉඩම් පරිභෝජනය හා විද්‍යාත්මක වාරි කළමනාකරණය පිළිබඳව වැඩමුළු සංවිධානය කිරීම හා එමගින් ගොවි ජනතාව දැනුවත් කිරීම.

*(ආ)* නිරන්තරයෙන් වර්ධනය වන නව තාක්ෂණය හා ක්‍රමවේදනයන් නිලධාරීන්ට හා ගොවි ජනතාවට සමීප කරවීමේ ආදර්ශන හා වැඩමුළු විධිමත්ව සංවිධානය කිරීම හා ඒ සඳහා ගොවි ජනතාවගේ ක්‍රියාකාරී සහභාගීත්වය තහවුරු කිරීම.

*(ඇ)* ප්‍රාදේශීය කාලගුණ රටාවන්, පළිබෝධ, පාංශු රටාවන් හා වගා ක්‍රමවේදය පාදක කරගත් පරීක්ෂණ කටයුතු දියත් කිරීම හා එම ප්‍රතිඵල මත කෙරෙන නිර්දේශ අදාළ පාර්ශවයන්ට ලබා දීම.

*(ඈ)* පසු අස්වනු තාක්ෂණයට හා පෙර ගිවිසුම් නිෂ්පාදනයේ විවිධ පැතිකඩ ගැන පුළුල් අවබෝධයක් ලබාදීම හා උපරිම වාසි ලබා ගැනීමේ උපාය මාර්ග පිළිබඳ නිෂ්පාදනය දැනුවත් කිරීම හා ඒ සඳහා අවශ්‍යවන යෙදවුම් නිෂ්පාදකයාට සුලභ කිරීම.

*(ඉ)* කෘෂි නිෂ්පාදන කල් තබා ගැනීමේ නවීනතම ක්‍රමවේදයන් හඳුන්වා දීම සඳහා දේශීය හා විදේශීය රාජ්‍ය නොවන සංවිධානවල සහයෝගය ලබාගැනීම හා සම්පත් උපරිම ආකාරයෙන් යොදා ගැනීම.

*(ඊ)* පළාතේ ස්වභාවික සම්පත් සංරක්ෂණය හා ඊට අදාළව යහපත් කළමනාකරණ ක්‍රම හඳුන්වා දීම.

දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව

7.1 මාසික දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේ අනිවාර්ය සාමාජිකයෙකු වන පළාත් කෘෂිකර්ම විෂය භාර ලේකම්වරයා දැනට එම කමිටුවේ සභාපතිත්වය දරන දිස්ත්‍රික් ලේකම්වරයා සමග එම කමිටුවේ සම සභාපතිත්වය දැරිය යුත්තේ ය. නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා එහි ලේකම් තනතුර දරනු ඇත.

ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටුව

7.2 ප්‍රාදේශීය ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටුවට එම කොට්ඨාසයේ සේවයේ නියුතු කෘෂිකර්ම ක්ෂේත්‍රයේ සියලුම නිලධාරීන් අනිවාර්ය සහභාගිත්වය ලබාදිය යුත්තේ ය.

පළාත් කෘෂිකර්ම උපදේශක කමිටුව

8. පළාත් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව පළාත වෙනුවෙන් සාමාජිකයින් 19 දෙනෙකුට නොඅඩු සංඛ්‍යාවකින් යුත් උපදේශක කමිටුවක් ස්ථාපිත කළ යුතු වන්නේ ය :-

(1) එම කමිටුවේ සභාපති ලෙස කෘෂිකර්ම ලේකම්වරයා කටයුතු කළ යුතුය ;

(2) එම කමිටුවේ ලේකම් පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා විය යුතුය ;

(3) බදුල්ල හා මොණරාගල දිස්ත්‍රික්කයන්හි දිස්ත්‍රික් ලේකම්වරුන් දෙදෙනා ;

(4) බදුල්ල හා මොණරාගල දිස්ත්‍රික්කවල නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂවරු දෙදෙනා ;

(5) ගොවිජන සේවා සහකාර කොමසාරිස්වරු දෙදෙනා ;

(6) පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂවරයා ;

(7) බදුල්ල හා මොණරාගල දිස්ත්‍රික්කයන්හි ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරීන් දෙදෙනෙක් ;

(8) අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ගොවිජන සේවා කමිටු නියෝජිතයින් හතර දෙනෙක් හා කෘෂිකර්ම කටයුතු ගැන හසල දැනුමක් ඇති වෙනත් නියෝජිතයින් හය දෙනෙක් ;

(9) සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් නිලධාරීන් දෙදෙනෙක්.

9.1 මෙම ප්‍රඥප්තියෙන් සැලසිය යුතු යැයි සඳහන් විධිවිධාන ක්‍රියාත්මක කිරීමෙහිලා, විෂය භාර අමාත්‍යවරයාට අදාළ උපදෙස්, යෝජනා හා මග පෙන්වීම.

උපදේශක කමිටුවේ වගකීම හා කාර්යභාරය

9.2 කෘෂිකර්ම ක්ෂේත්‍රය තුළ කලින් කලට පැන නගින විවිධාකාර ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා විෂයභාර අමාත්‍යවරයාට උපදෙස් ලබා දීම.

9.3 කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළව අමාත්‍යවරයා විසින් හෝ ලේකම්වරයා විසින් අවධානයට යොමු කරනු ලබන කරුණක් හෝ කරුණු සම්බන්ධයෙන් ද, කමිටුව විසින් උපදෙස් දිය යුතු යැයි අදහස් කරනු ලබන වෙනත් කරුණු සම්බන්ධයෙන් ද අමාත්‍යවරයාට උපදෙස් දීම, උපදේශක කමිටුවේ වගකීමක් වන්නේ ය.

9.4 උපදේශන කමිටුවේ කාර්ය පටිපාටිය, රැස්වීම් කැඳවීම හා පැවැත්වීම පිණිස විධිවිධාන යෙදීම අමාත්‍යාංශ ලේකම්වරයාගේ වගකීම වේ.

කමිටුවේ සාමාජිකත්වය අහෝසිවීම

10.1 කමිටුවේ සාමාජිකයෙකු ලෙස අමාත්‍යවරයා නම් කරන සාමාජිකයකු ඕනෑම අවස්ථාවක එම තනතුරෙන් ඉවත් කරනු ලැබිය හැකි අතර, අමාත්‍යවරයාට ලිඛිතව තම ඉල්ලා අස්වීම භාරදීමෙන් යම් කමිටු සාමාජිකයෙකුට සිය තනතුරෙන් ඉල්ලා අස්විය හැකිය.

10.2 කමිටුවේ සභාපති හෝ වෙනත් සාමාජිකයෙකුගේ අයහපත් සෞඛ්‍ය තත්ත්වය නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරවීම නිසා හෝ වෙනත් හේතුවක් නිසා හෝ තනතුරේ රාජකාරී ඉටු කිරීමට නොහැකි වන අවස්ථාවක, පළාත් අමාත්‍යවරයා විසින් එම තනතුරේ රාජකාරී ආවරණය කිරීම සඳහා වෙනත් පුද්ගලයෙකු අවස්ථානුකූලව පත් කළ යුතු වන්නේ ය.

10.3 කමිටුවේ සාමාජිකයෙකු සිය තනතුරෙන් ඉල්ලා අස්වුවහොත් හෝ තනතුර අත්හැර ගියහොත් හෝ අමාත්‍යවරයා විසින් තනතුරෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ මීස පත් කළ දින සිට අවුරුදු තුනක කාලයකට එම තනතුර දැරිය යුතුය.

ප්‍රාදේශීය උපදේශක කමිටු

11.1 පළාතේ යම් කොටසක කෘෂිකාර්මික කටයුතු හා ඊට අදාළව අවශ්‍ය වන කරුණු සම්බන්ධයෙන් පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂට උපදෙස් දීම සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් පහත සඳහන් පරිදි උපදේශක කමිටු අමාත්‍යවරයා විසින් පත් කළ හැකිය:–

11.2 *(අ)* ප්‍රාදේශීය ලේකම්වරයා ;
*(ආ)* ඌව පළාතේ ප්‍රාදේශීය සභාවක සභාපතිවරයෙකු ;
*(ඇ)* කොට්ඨාසයේ සියලුම ගොවිජන සේවා කමිටු සභාපතිවරුන් ;
*(ඈ)* කොට්ඨාසයේ සියලුම ගොවිජන සේවා ප්‍රාදේශීය නිලධාරීන් ;
*(ඉ)* කොට්ඨාසයේ සියලුම කෘෂිකර්ම උපදේශකවරුන් ;
*(ඊ)* කොට්ඨාසයේ ගොවිජන සේවා කමිටුවේ බල ප්‍රදේශයකින් එක් ග්‍රාම සේවා නිලධාරියෙකු බැගින්.

11.3 ප්‍රාදේශීය ලේකම්වරයා එකී කොට්ඨාසයේ ප්‍රාදේශීය උපදේශක කමිටුවේ සභාපති විය යුතුය. එම කොටසේ කෘෂිකර්ම උපදේශකවරයකු එහි ලේකම් තනතුර දැරිය යුතුය.

11.4 කෘෂිකර්ම අධ්‍යක්ෂ හෝ සහකාර අධ්‍යක්ෂ විසින් ප්‍රාදේශීය උපදේශක කමිටුවක සැලකිල්ලට යොමු කරනු ලබන සියලුම කරුණු සම්බන්ධව එම උපදේශක කමිටුව නිශ්චිත කාලයක් තුළ දී නියමිත ආකාරයකට කටයුතු කර අවසාන කළ යුතුය.

12. *(අ)* පළිබෝධ නාශක පනත ක්‍රියාත්මක කිරීම

*(ආ)* පොහොර පනත හා පාංශු සංරක්ෂණ පනත ක්‍රියාත්මක කිරීම

*(ඇ)* බීජ පනත ක්‍රියාත්මක කිරීම

*(ඈ)* කෘෂිකර්මයට අදාළ වෙනත් අණපනත් ක්‍රියාත්මක කිරීම.

වෙනත් කරුණු

13.1 මෙම ප්‍රඥප්තියේ වගන්තීන් හා නියමයන් ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් සභාවේ අනුමැතිය ඇතිව රෙගුලාසි පැනවීම පළාත් අමාත්‍යවරයා විසින් කරනු ලැබිය යුතුය.

අමාත්‍යවරයා විසින් රෙගුලාසි පැනවීම

13.2 මෙම ප්‍රඥප්තිය හෝ මෙම ප්‍රඥප්තිය යටතේ පනවනු ලබන රෙගුලාසිවලින් පරිබාහිරව පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම්වරයා හෝ පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ හෝ ඔහුගේ නිලධාරීන් විසින් ඔවුන්ගේ අභිමතය පරිදි කරනු ලබන නියමයන් හෝ තීරණයන් අභියාචනයක් මත හෝ එසේ නොමැතිව නිශ්ප්‍රභා කිරීමේ බලය අමාත්‍යවරයා සතුවේ. ඒ අනුව අමාත්‍යවරයාගේ තීරණය අවසන් තීරණය වන අතර එය ක්‍රියාත්මක කිරීම අමාත්‍යාංශ ලේකම්වරයාගේ අධීක්ෂණයට යටත්ව පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා හා ඔවුන්ගේ යටත් නිලධාරීන් ද එම තීරණයට බලපාන සියලු පුද්ගලයන් ද බැඳී සිටිත්.

අමාත්‍යවරයාගේ බලතල

14. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ ප්‍රඥප්තියෙහි—

අර්ථ නිරූපනය

"පළාත් සභාව" යන්නෙන්, ඌව පළාතේ පළාත් සභාව අදහස් වේ ;

"ආණ්ඩුකාරවරයා" යන්නෙන්, ඌව පළාතේ ආණ්ඩුකාරවරයා අදහස් වේ ;

"අමාත්‍යවරයා" යන්නෙන්, ඌව පළාතේ කෘෂිකර්ම විෂය භාර අමාත්‍යවරයා අදහස් වේ ;

"පළාත් සභාව විසුරුවා හැරුණු අවස්ථාවක අමාත්‍යවරයා යන්නෙන් ඌව පළාත් ආණ්ඩුකාරවරයා" අදහස් වේ ;

"ලේකම්" යන්නෙන්, ඌව පළාතේ කෘෂිකර්ම විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා අදහස් වේ ;

"ප්‍රාදේශීය ලේකම්වරුන්" යන්නෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පරිපාලන බලධාරීන් අදහස් වේ ;

"දෙපාර්තමේන්තුව" යන්නෙන් පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව අදහස් වේ ;

"පළාත් අධ්‍යක්ෂ" යන්නෙන් ඌව පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ හා මෙම ප්‍රඥප්තිය යටතේ අධ්‍යක්ෂවරයාගේ බලතල හා රාජකාරි ඉටු කිරීම සඳහා අධ්‍යක්ෂවරයා විසින් බලය පැවරුණු වෙනත් නිලධාරියෙකු අදහස් වේ ;

"නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන්" යන්නෙන් නියෝජ්‍ය ඌව පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන් අදහස් වේ ;

"පළාත් කෘෂිකර්ම උපදේශක කමිටුව" යන්නෙන් 8 වැනි වගන්තිය යටතේ ස්ථාපනය කරන ලද පළාත් ප්‍රාදේශීය උපදේශක කමිටුව අදහස් වේ ;

"ප්‍රාදේශීය කෘෂිකර්ම උපදේශක කමිටු" යන්නෙන් 11 වැනි වගන්තිය යටතේ ස්ථාපනය කරන ලද ප්‍රාදේශීය උපදේශක කමිටු අදහස් වේ ;

15. මෙම ප්‍රඥප්තියේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

වචනාර්ථ

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

07-205/2

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාතේ පළාත් සභාව

ඌව පළාතේ පළාත් සභාවේ 2010 අංක ........................ දරන සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය ප්‍රඥප්ති කෙටුම්පත

මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවීමෙන් දින 10ක් ඉක්ම ගිය පසු ඌව පළාතේ පළාත් සභාවට ඉදිරිපත් කරන බව දන්වා සිටිනු ලැබේ. මෙම ප්‍රඥප්තියේ අඩංගු කරුණු සම්බන්ධයෙන් යම්කිසි කරුණක් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන්නේ නම් මෙම දැන්වීමෙන් දින 10ක් තුළ දී එකී කරුණු මා වෙත දැනුම් දිය යුතුය.

අනුර රවීන්ද්‍ර විදානගමගේ,
ඌව පළාතේ කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන,
සත්ව නිෂ්පාදන, මිරිදිය ධීවර, පරිසර හා
සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍ය.

**ඌව පළාතේ පළාත් සභාවේ 2010 අංක .................... දරන සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය ප්‍රඥප්තිය**

***ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වැනි උපලේඛනයේ I වැනි ලැයිස්තුවේ අංක 20 යටතේ පැවරී ඇති බලතල යටතේ, ඌව පළාතේ සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවාවන් ඵලදායි හා කාර්යක්ෂම ලෙස පවත්වාගෙන යාම සඳහා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවක් පිහිටුවීම හා ඊට අනුශාංගික වන කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි***

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය.

1. මෙම ප්‍රඥප්තිය ඌව පළාතේ සභාවේ 2008 අංක ............... දරන සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර එය ඌව පළාත් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලබන දින සිට හෝ නියම කරන පසු දිනක සිට ක්‍රියාත්මක වීම බලාත්මක වන්නේ ය.

දෙපාර්තමේන්තුවක් පිහිටුවීම හා ව්‍යුහය.

2.1 මෙම ප්‍රඥප්තියේ අරමුණු ඉටු කිරීම සඳහා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවක් පිහිටුවිය යුතු අතර එහි ප්‍රධානියා වශයෙන් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ I වැනි පංතියේ නිලධාරියෙකු ඌව පළාත් ආණ්ඩුකාරවරයා විසින් පත් කරනු ලැබිය යුතුය. එම දෙපාර්තමේන්තුවට අදාළ සංවිධාන ව්‍යුහය උපලේඛන අංක I හි දක්වා ඇත ;

2.2 මෙම දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය ඉටුකිරීම සඳහා අවශ්‍යවන අතිරේක අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් හා වෙනත් නිලධරයන්ද, පත් කළ යුතුය. එම කාර්ය මණ්ඩල පත් කිරීම ස්ථාන මාරු කිරීම හා ඔවුන් විෂයෙහි විනය පාලනය කිරීම හා වෙනත් අනුශාංගික කරුණු සම්බන්ධයෙන් 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධාන අදාල වන්නේ ය ;

2.3 දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය ඉටු කිරීමට අවශ්‍ය දිස්ත්‍රික්, ප්‍රාදේශීය හා ග්‍රාමීය මට්ටමෙන් ආයතන පිහිටුවිය හැක්කේ ය ;

2.4 මෙම ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා පත් කරනු ලබන නිලධාරින් හා සේවකයින් ආයතන සංග්‍රහයේ (පළාත් සභාවේ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබීමෙන් පසු) අර්ථානුකූලව පළාත් රාජ්‍ය සේවයේ සේවකයින් ලෙස සැලකිය යුතුය ;

2.5 මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීමට පෙරාතුව පැවති සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සේවය කරනු ලැබූ නිලධාරින් හා සේවකයින් සිය මනාපය පළ කිරීමෙන් පසුව මෙම ප්‍රඥප්තිය යටතේ පත් කරනු ලැබූවන් සේ සැලකිය යුතු වන්නේ ය.

3. ඌව පළාතේ පළාත් සභාවේ සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය විෂය භාර අමාත්‍යවරයාගේ සාමාන්‍ය හා විශේෂ විධානයන්ට යටත්ව එම අමාත්‍යාංශයේ ලේකම්වරයා මෙම ප්‍රඥප්තිය පරිපාලනය කිරීම භාරව සිටිය යුතුය.

බලතල පැවරීම.

4. මෙම ප්‍රඥප්තිය යටතේ පළාත් අධ්‍යක්ෂවරයාට පැවරෙන බලතල 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධි විධාන අනුව පත්කර ඇති නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්ට පළාත් අධ්‍යක්ෂවරයා විසින් පවරා දිය හැක්කේ ය.

දෙපාර්තමේන්තුවෙහි කාර්ය භාරය.

5.1 පළාත් මට්ටමේ පශු සම්පත් සංවර්ධන ව්‍යාපෘති සහ වැඩ සටහන් සැලසුම්කරණය, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.

5.2 සත්ව පාලනය පිළිබඳ නව තාක්ෂණික දැනුම ජනතාවට ලබාදීම සඳහා වූ ව්‍යාපෘති සේවාවන් පවත්වාගෙන යාම.

5.3 සත්ව රෝග විනිශ්චය, රෝගී සතුන්ට ප්‍රතිකාර කිරීම, රෝග ඇතිවීම, වැළැක්වීම සඳහා සත්ව සෞඛ්‍ය සේවා පවත්වාගෙන යාම. (සුරතල් සතුන් ද ඇතුලත් විය යුතුය.).

5.4 සත්ව පාලනය සම්බන්ධයෙන් ආදර්ශන පවත්වාගෙන යාමෙන් ජනතාව සත්ව නිෂ්පාදන කටයුතු කෙරේ උනන්දු කරවීම.

5.5 ගොවිපලවල සතුන්ගේ ආරය උසස් කිරීම සඳහා කෘත්‍රිම සිංචනය ඇතුළු අභිජනන සේවාවන් පවත්වාගෙන යාම.

5.6 උසස් ආරයේ ගවයින්, එළුවන්, ඌරන් හා කුකුළන් ඇතුලු සතුන් ගොවීන් වෙත ලබා දීම.

5.7 වැඩි දියුණු කරන ලද තෘණ වර්ග, රනිල වර්ග වගා කිරීම සඳහා අවශ්‍ය රෝපණ ද්‍රව්‍ය ගොවීන්ට ලබා දීම ඇතුළු සත්ව පෝෂණ ප්‍රවර්ධන හා පශු ආහාර නිෂ්පාදන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

5.8 ඌව පළාතේ වෙනත් ආයතන හා සංවිධාන මඟින් සිදු කරනු ලබන පශු සම්පත් සංවර්ධන කටයුතු වලදී අවශ්‍ය තාක්ෂණික හා උපදේශන සේවා ලබා දීමට කටයුතු කිරීම.

5.9 සත්ව පාලනය සම්බන්ධයෙන් වූ අණ පනත්, රෙගුලාසි පළාත තුල ක්‍රියාත්මක කිරීමට වගබලා ගැනීම.

5.10 සත්ව නිෂ්පාදන අලෙවි කටයුතු ප්‍රවර්ධනය සඳහා නිෂ්පාදකයින්ගේ සංවිධාන පිහිටුවීම හා අදාළ වන්නාවූ වෙනත් සේවාවන් සැපයීම හා නැවුම් කිරි භාවිතය ප්‍රචලිත කිරීම.

5.11 සත්ව නිෂ්පාදන ක්ෂේත්‍රයේ නියැලී සිටින ගොවීන් හා ඔවුන් දිරිගන්වන නිලධාරීන් ඇගයීමට ලක් කිරීම සඳහා පළාත් තරග පැවැත්වීම හා සම්මාන ප්‍රදානෝත්සව සංවිධානය කිරීම.

6. මෙම ප්‍රඥප්තිය යටතේ වන අරමුණු හා කාර්ය භාරයන් ඉටු කර ගැනීමට අවශ්‍ය වන සියලු බලතල ලිඛිත නීතියේ සීමාවන්ට යටත්ව පළාත් අධ්‍යක්ෂවරයා සතු වන්නේ ය. තමන් වෙත පැවරෙන කාර්යයන් ඉටු කිරීමට අදාළව පළාත් අධ්‍යක්ෂවරයා විසින් පළාත් සභාවේ විවිධ ආයතනවලින්, පළාත් පාලන ආයතනවලින්, මහජන සංවිධානවලින් හෝ පුද්ගලයන්ගෙන් යම් තොරතුරක් ඉල්ලා සිටිය හැකි අතර, එකී ආයතන හා තැනැත්තන් එකී තොරතුරු සැපයීමට බැඳී සිටිය යුතුය. පළාත් අධ්‍යක්ෂවරයා සතු බලතල

7. මෙම ප්‍රඥප්තියේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය විෂය භාර අමාත්‍යවරයාට උපදෙස් ලබා දීම පිණිස පළාත් උපදේශක මණ්ඩලයක් පිහිටුවනු ලැබිය යුතුය. එකී උපදේශක මණ්ඩලය විෂයභාර අමාත්‍යවරයා විසින් පත් කළ යුතුවන අතර, එහි සංයුතිය පහත පරිදි විය යුතුය :— පළාත් උපදේශක මණ්ඩලයක් පිහිටුවීම

(i) විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා ;
(ii) පළාත් අධ්‍යක්ෂවරයා ;
(iii) සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අතිරේක අධ්‍යක්ෂ ;
(iv) සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් දෙදෙනෙක් ;
(v) ඌව පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ ;
(vi) පශු සම්පත් නිෂ්පාදකයින්ගේ සංගම්වල නියෝජිතයින් දෙදෙනෙක් ;
(vii) විෂය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන අදාළ විෂ්‍ය ක්ෂේත්‍රයේ නියෝජිතයින් දෙදෙනෙක් (දිස්ත්‍රික් දෙක සඳහා) ;
(viii) කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලයේ නියෝජිතයෙක් ;
(ix) ජාතික පශු සම්පත් මණ්ඩලය විසින් නම් කරනු ලබන නියෝජිතයෙක් ;
(x) "මිල්කෝ" ආයතනය විසින් නම් කරනු ලබන නියෝජිතයෙක්.

විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා උපදේශක මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු අතර, පළාත් අධ්‍යක්ෂවරයා එහි ලේකම් ධුරය දැරිය යුතුය.

8.1 මෙම ප්‍රඥප්තියෙන් සැලසිය යුතු යැයි සඳහන් විධිවිධාන ක්‍රියාත්මක කිරීමෙහි ලා විෂය භාර අමාත්‍යවරයාට අවශ්‍ය උපදෙස්, යෝජනා හා මගපෙන්වීම ලබා දීම ; උපදේශක මණ්ඩලයේ වගකීම හා කාර්යභාරය

8.2 පශු සම්පත් හා සත්ව සෞඛ්‍ය ක්ෂේත්‍රයේ කලින් කලට පැන නගින විවිධ ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා අවශ්‍ය උපදෙස් හා යෝජනා ඉදිරිපත් කිරීම ;

8.3 ප්‍රඥප්තියෙන් පශු සම්පත් හා සත්ව සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාළව විෂය භාර අමාත්‍යවරයා හෝ ලේකම්වරයා විසින් හෝ තමන්ගේ අවධානයට යොමු කරනු ලබන කරුණක් හෝ කරුණු සම්බන්ධයෙන් ද, උපදේශක මණ්ඩලය විසින් උපදෙස් දිය යුතු යැයි අදහස් කරනු ලබන වෙනත් යම් කරුණු සම්බන්ධයෙන් ද අමාත්‍යවරයාට උපදෙස් දීමද එම මණ්ඩලයේ කාර්ය භාරය වන්නේ ය. ;

8.4 උපදේශක මණ්ඩලයේ කාර්ය පරිපාටිය, රැස්වීම් කැඳවීම් හා පැවැත්වීම පිණිස විධිවිධාන යෙදීම අමාත්‍යාංශ ලේකම්වරයාගේ වගකීම වන්නේ ය ;

උපදේශක මණ්ඩලයේ සාමාජිකත්වය අහෝසි වීම

9.1 විෂයභාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන උපදේශක මණ්ඩලයේ සාමාජිකයෙකු ඕනෑම අවස්ථාවක මණ්ඩලයේ සාමාජිකත්වයෙන් ඉවත් කරනු ලැබිය හැකි අතර, අමාත්‍යවරයාට ලිඛිතව තම ඉල්ලා අස්වීම භාරදීමෙන් යම් කමිටු සාමාජිකයකු හට සාමජිකත්වයෙන් ඉල්ලා අස්විය හැකිය ;

9.2 උපදේශක මණ්ඩලයේ සභාපති හෝ වෙනත් සාමාජිකයෙකුගේ අයහපත් සෞඛ්‍ය තත්ත්වය නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ තම සාමාජික තනතුරේ රාජකාරි ඉටු කිරීමට නොහැකි වන අවස්ථාවක අමාත්‍යවරයා විසින් එම තනතුරේ රාජකාරි ආවරණය කිරීම සඳහා වෙනත් අයකු අවස්ථානුකූලව පත් කළ යුතු වන්නේ ය ;

9.3 උපදේශක මණ්ඩලයේ සාමාජිකයෙකු සිය තනතුරෙන් ඉල්ලා අස්වුවහොත් හෝ තනතුර හැර ගියහොත් හෝ අමාත්‍යවරයා විසින් තනතුරෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ මිස පත් කළ දින සිට අවුරුදු තුනක කාලයක් උපදේශක මණ්ඩලයේ සාමාජිකත්වය දැරිය යුතුය. මොනයම් හේතුවක් නිසාවෙන් හෝ සාමාජිකත්වය අහෝසිවන අයකු වෙනුවෙන් පත් කෙරෙන නව සාමාජිකයා එසේ ඉවත් වෙන සාමාජිකයාගේ තුන් අවුරුදු කාලයෙන් ඉතිරිව ඇති කාලය සඳහා පමණක් සාමාජිකත්වය දැරිය යුතු වන්නේ ය ;

ප්‍රාදේශීය උපදේශක කමිටු

10. ඌව පළාතේ සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය කටයුතු හා ඊට අදාළව අවශ්‍යවන කරුණු සම්බන්ධයෙන් පළාත් අධ්‍යක්ෂවරයාට උපදෙස් දීම සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් මෙහි පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත ප්‍රාදේශීය උපදේශක කමිටු විෂය භාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතුය.

(i) කමිටුවේ සභාපතිවරයා අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්වරයා විය යුතු අතර, කොට්ඨාසයේ පශු වෛද්‍යවරයා එකී කමිටුවේ ලේකම්වරයා විය යුතුය ;

කමිටුවේ අනිකුත් සාමාජිකයින් වශයෙන්.-

(ii) අදාල බල ප්‍රදේශයේ කෘෂිකර්ම සහකාර අධ්‍යක්ෂ ;
(iii) අදාල බල ප්‍රදේශයේ කෘෂිකර්ම උපදේශකවරුන් ;
(iv) පශු සම්පත් නිෂ්පාදනයේ නියුතු සංවිධානවල නියෝජිතයින් දෙදෙනෙක් ;
(v) අදාල බල ප්‍රදේශයේ ප්‍රාදේශීය ගොවිජන සේවා නිලධාරීවරුන් ;
(vi) අදාල බල ප්‍රදේශයේ කෘෂි රක්ෂණ නිලධාරිවරුන්;
(vii) විෂය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන නියෝජිතයෙක්.

පත් කළ යුත්තේ ය.

ගොවි සංවිධාන ලියාපදිංචි කිරීම

11. පළාත තුල පවත්වාගෙන යනු ලබන කිරිගොවි සංවිධාන, ස්වයංපාලිත කිරි නිෂ්පාදිත සංගම්, කිරිගොවි හා අනිකුත් සත්ව පාලන ගොවි කණ්ඩායම් ප්‍රාදේශීය පශු වෛද්‍ය නිලධාරින්ගේ මාර්ගෝපදේශ මත පළාත් අධ්‍යක්ෂවරයා මගින් ලියා පදිංචිය ලබා ගත යුතුය. එසේ ලියාපදිංචි කරනු ලබන ගොවි සංවිධාන ලේඛනය පළාත් අධ්‍යක්ෂවරයා විසින් යාවත්කාලීනව පවත්වාගෙන යා යුතුය.

මුදල් ප්‍රතිපාදන

12. *(අ)* මෙම ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද ආයතනවල පරිපාලනය හා නඩත්තුව සඳහාත් දෙපාර්තමේන්තුව මගින් වාර්ෂිකව සකස් කරනු ලබන සංවර්ධන සැලැස්මේ යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන මූල්‍ය ප්‍රතිපාදන පළාත් සභා වාර්ෂික අයවැය ලේඛනයෙන් ලබා දිය යුතුය.

*(ආ)* ලිඛිත නීතියෙහි විධිවිධානයන්ට යටත්ව දෙපාර්තමේන්තුවේ කටයුතු සඳහා දේශීය හා විදේශීය ප්‍රභවයන්ගෙන් ලැබෙන වෙනත් මූල්‍ය ප්‍රතිපාදන ද, අදාළ කරගත හැකි ය.

විගණන කටයුතු

*(ඇ)* 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23 වැනි වගන්තියේ අදාල ප්‍රතිපාදනවලට යටත්ව විගණන කටයුතු සිදුවිය යුතු අතර, පළාත් අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ විසින් ද විගණන කටයුතු කළ යුතු යි.

වාර්ෂික පාලන වාර්තා

13.1 වර්ෂයක් තුල දී ඌව පළාත තුල සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවා පවත්වාගෙන ගිය ආකාරය, පැන නැගුනු ගැටළු හා ඒවා විසඳීම සඳහා ගත් පියවර හා සත්ව සෞඛ්‍ය පිළිබඳ උපනතීන් ඇතුලත් වාර්ෂික පාලන වාර්තාවක් එකී වර්ෂය ඉකුත්ව මාස 03 ක් ගත වීමට පෙර පළාත් අධ්‍යක්ෂවරයා විසින් විෂය භාර අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුත්තේ ය ;

13.2 එම වාර්තාව අමාත්‍යවරයා විසින් කඩනමින් පළාත් සභාව වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ ය.

නියෝග පැනවිය හැකි බව

14.1 මේ ප්‍රඥප්තියෙන් නියම කරනු ලැබූ හෝ නියෝග පැනවීමට බලය දී ඇති හෝ යම් කාරණයක් සම්බන්ධයෙන් ද, පහත සඳහන් කාරණා සම්බන්ධයෙන් ද, අමාත්‍යවරයා විසින් රෙගුලාසි පැනවිය හැක්කේ ය :–

(i) සත්ව පාලනය පිළිබඳ ප්‍රතිපත්තිය සකස් කිරීම ;
(ii) දේශීය හා විදේශීය ප්‍රභවයන්ගෙන් ආධාර ලබා ගැනීම ;

(iii) සත්ව පාලනයේ යෙදෙන ජනතාව වෙත පහසුකම් සැපයීම ;
(iv) හදිසි විමර්ශන කටයුතු කරගෙන යාම ;
(v) පරිශ්‍රමික හා දීමනා ගෙවීම ;
(vi) ආයතන හා සේවාවන්හි කාර්ය සාධනය ඇගැයීම ;
(vii) දෙපාර්තමේන්තු කටයුතු විමර්ශනය කිරීමේ විධිවිධාන සැලසීම ;
(viii) පළාතේ සත්ව ආරක්ෂණ කටයුතුවලට අදාළ නියෝග පැනවීම.

14.2 14.1 වැනි උපවගන්තිය යටතේ සාදන ලද සෑම රෙගුලාසියක්ම *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලබන දිනයේ සිට හෝ නියම කරනු ලබන පසු දිනයක සිට හෝ ඒවා ක්‍රියාත්මක විය යුතුය.

14.3 14.1 වැනි උපවගන්තිය යටතේ සාදන ලද සෑම රෙගුලාසියක්ම *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබීමෙන් පසු හැකි ඉක්මණින්ම අනුමැතිය සඳහා එය ඌව පළාතේ පළාත් සභාවට ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එසේ අනුමත නොකරනු ලැබූ යම් රෙගුලාසියක් වෙතොත් එය අනුමත කරනු නොලැබූ දින සිට අවලංගු කළාසේ සැලකිය යුතු නමුත්, එම නියෝග යටතේ ගනු ලැබූ කවර හෝ ක්‍රියා මාර්ගයක් කෙරෙහි එම අවලංගුවීම බලනොපෑ යුතුය.

14.4 යම් නියෝගයක් එසේ අවලංගු කරනු ලැබූ සේ සලකනු ලබන දිනය *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතුය.

15. මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීමට පෙරාතුව වූ දිනයෙහි සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය විෂය ක්‍රියාත්මක කිරීම උදෙසා යම් වත්කමක්/බලයක් හෝ දේපළක් හෝ පිරිස් බලයක් යොදවා තිබුනේ නම් හෝ ආකෘතියක්, දැන්වීමක්, බලපත්‍රයක්, ලේඛනයක් හෝ එවැනි ලියවිල්ලක් භාවිත කළ යුතු යැයි නියම කර තිබුනේ නම් ඒවා සියල්ල මෙම ප්‍රඥප්තිය යටතේ රජය විසින් පවරා දුන්නා හෝ වෙනයම් ක්‍රමයකින් ලැබුනා වූ හෝ මෙම දෙපාර්තමේන්තුවට පැවරී ඇති වත්කම් හා දේපළ වශයෙන් සැලකිය යුතුය. වත්කම් හා දේපළ

16.1 මෙම ප්‍රඥප්තියේ හෝ ඒ යටතේ හෝ සම්පාදනය කරන ලද යම් නියෝග හෝ විධාන හෝ කඩ කිරීම හෝ ඒ විධිවිධාන අනුව ක්‍රියා කිරීම පැහැර හැරීම හෝ මේ ප්‍රඥප්තිය හෝ ඒ යටතේ සම්පාදිත නියෝග යටතේ යම් කාර්යයක් පැවරී ඇති අයෙකුට එම කාර්ය ඉටු කිරීම කෙරෙහි වුවමනාවෙන්ම අවහිර කිරීම, ලිඛිත නීතියේ විධිවිධානයන්ට යටත්ව මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් වන්නේ ය. ප්‍රඥප්තියේ විධිවිධාන පැහැර හැරීම සම්බන්ධයෙන් දණ්ඩන නියම කිරීම

16.2 මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් සිදු කරන සෑම තැනැත්තෙක්ම මහෙස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් වරදකරු කරනු ලැබූ විට රුපියල් දෙදහස නොඉක්මවන දඩයකට හෝ අවුරුදු දෙකක කාලයකට හෝ දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතුය.

17. 1. ''ආණ්ඩුකාරවරයා'' යන්නෙන් ඌව පළාත් ආණ්ඩුකාරවරයා අදහස් කෙරේ. අර්ථ නිරූපණය

2. ''අමාත්‍යවරයා'' යන්නෙන් ඌව පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය විෂය භාර අමාත්‍යවරයා අදහස් කෙරේ.

3. ''පළාත'' යන්නෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනයේ දක්වා ඇති ඌව පළාත් බල ප්‍රදේශය අදහස් කෙරේ.

4. ''පළාත් සභාව'' යන්නෙන් ඌව පළාත් සභාව අදහස් කෙරේ.

5. ''සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවා පළාත් අධ්‍යක්ෂ'' යන්නෙන් මෙම ප්‍රඥප්තියේ 2.1 වගන්තිය යටතේ පත් කරනු ලබන නිලධාරියා අදහස් කෙරේ.

6. පළාත් සභාව විසුරුවා හළ අවස්ථාවක නැවත පළාත් සභාවක් පත්වන තෙක් මෙම ප්‍රඥප්තියේ විෂයභාර අමාත්‍යවරයා යනුවෙන් සඳහන් සෑම කරුණක් සම්බන්ධවම ''ඌව පළාතේ ආණ්ඩුකාරවරයා'' යන්න ආදේශ කරනු ලැබේ.


7. ''සත්ව ආරක්ෂණ කටයුතු'' යන්නෙන් අනවසරයෙන්, ප්‍රවාහනය කිරීම හා මරණයට නුසුදුසු සතුන් මරණයට පත් කිරීම වැළැක්වීම අදහස් කෙරේ.

8. ''සුරතල් සතුන්'' යන්නෙන් නිවෙස්වල ඇති කරනු ලබන බල්ලන්, බළලුන්, පක්ෂීන් සහ සුරතලයට ඇති කරනු ලබන වෙනත් සතුන් අදහස් වේ.

18. මෙම ප්‍රඥප්තියෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය. වචනාර්ථ

උපලේඛන I

**පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අමාත්‍යාංශයේ**
**සංවිධාන ව්‍යුහය**




07-205/1

---

# තනතුරු - ඇබෑර්තු

**බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර විගණන අංශයේ අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන) තනතුර සඳහා බඳවා ගැනීම**

බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර විගණන අංශයේ අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන) තනතුරට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ 03 ඡේදයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති බස්නාහිර පළාතේ ස්ථිර පදිංචි රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව 01 කි.

*සටහන.-* මෙම පත්වීම් සම්බන්ධයෙන් අවසාන තීරණය බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමා සතුවේ. බස්නාහිර පළාතේ ප්‍රධාන ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර විගණන අංශයට පත්වීම් ලබන නිලධාරියෙකු පත්වීම් ලබන දිනයේ සිට වෙනත් කිසිම සේවාවකට අයත් නොවිය යුතුය.

2.1 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය : රු. 22,935 - 10 x 645 - 8 x 790 - 17 x 1,050 - රු. 53,555 වේ. (එස්එල්-1-2006 හි 22 වැනි පියවර)

2.2 *වයස් සීමාව.-* රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා වන බැවින් වයස් සීමා අදාළ නොවේ.

2.3 *සේවා කොන්දේසි.-* අනුමත සේවා ව්‍යවස්ථාව අනුව සේවා කොන්දේසි තීරණය වේ. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

03. *සුදුසුකම් :*

*(අ)* බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු වීම සහ

*(ආ)* වසර 03 ක සේවා කාලයක් ඇති බස්නාහිර පළාතේ ප්‍රධාන ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර විගණන අංශයේ 11 පංතියේ නිලධාරියෙකු වීම හෝ

*(ඇ)* ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I පන්තියේ නිලධාරියෙකු වීම හෝ

*(ඈ)* ශ්‍රී ලංකා විගණන සේවයේ I පන්තියේ II ශ්‍රේණියේ නිලධාරියෙකු වීම.

04. *බඳවා ගැනීමේ ක්‍රමය.-* අයදුම්පත් ඉදිරිපත් කර ඇති ඉහත 03 ඡේදය අනුව සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන් විධිමත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අනතුරුව බඳවා ගැනීම කරනු ලැබේ.

05. *ඉල්ලුම් කළ යුතු පිළිවෙල.-*

5.1 මෙම නිවේදනයේ අග ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව A4 ප්‍රමාණයේ කඩදාසිවල සකස් කර, සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2010.07.31 දින හෝ එදිනට පෙර ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.), නිදහස් චතුරශ්‍රය, කොළඹ 07 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන) තනතුරට බඳවා ගැනීම" යනුවෙන් සඳහන් කළ යුතුය. එසේ කිරීමට අපොහොසත් අයදුම්කරුවන් නුසුදුස්සන් සේ සලකනු ලැබේ. ඉල්ලුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ. (දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් අමාත්‍යාංශ ලේකම්/දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතුය) ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම්දීකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

06. *වෙනත් කොන්දේසි.—* බස්නාහිර පළාත් විගණන සේවය සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇති බඳවා ගැනීමේ පරිපාටියේ සියළු කොන්දේසීන්ට ඔබ යටත් වේ.

07. නිවේදනයේ ඇති සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත 2010.07.31 දින හෝ එදිනට පෙර අයදුම්පත් ඉදිරිපත් කර ඇති සියලුම අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයට කැඳවීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. කිසියම් අවස්ථාවක දී නිවේදනය අනුව අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ පත්වීම ලැබීමට ඇති හිමිකම අවලංගු කරනු ලැබේ. සෑම අයදුම්කරුවෙක්ම තනතුරට අදාළ සියලු සුදුසුකම් 2010.07.31 දිනට හෝ එදිනට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

08. අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අදාළ කරුණු හෝ එම නිවේදනයත් අනාවරණය නොවන වෙනත් කරුණු සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වේ.

වී. රාජපක්ෂ,  
ලේකම්,  
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

බස්නාහිර පළාත.

ආදර්ශ අයදුම්පත්‍රය

*බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර විගණන අංශයේ අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන) තනතුර සඳහා බඳවා ගැනීම*

01. *(අ)* මුලකුරු සමඟ නම :——————.
*(ආ)* සම්පූර්ණ නම

02. උපන් දිනය :——————.

03. ජාතික හැඳුනුම්පත් අංකය :——————.

04. දුරකථන අංක :——————. රාජකාරි :——————. පෞද්ගලික :——————.

05. දැනට සේවය කරන, සේවා ස්ථානය හා ලිපිනය :——————.

06. සේවය කරන ස්ථානය අයත් අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව :——————.

07. ස්ථිර පදිංචි ලිපිනය :——————.

08. 2010.07.31 වැනි දිනට බස්නාහිර පළාත තුළ පදිංචි කාල සීමාව :
අවු.:——————. මාස:——————. දින :——————.

09. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 03 ඡේදය අනුව :
(i) දැනට දරන තනතුර :——————.
(සේවය/පංතිය හා ශ්‍රේණිය සඳහන් කරන්න)
(ii) එම තනතුරට පත් වූ දිනය :——————.
2010.07.31 වැනි දිනට එම තනතුරේ සේවා කාලය :——————.

10. (i) රාජ්‍ය සේවය/පළාත් රාජ්‍ය සේවයට අයත් නිලධාරියෙකු ද යන වග :——————.
(ii) පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කර තිබේ නම්, ඒ බව හා අන්තර්ග්‍රහණය කළ දිනය :——————.

11. 2010.07.31 වැනි දිනට පූර්වාසන්න පස් වසර තුළ සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබේද ? නොමැතිනම් විස්තර ලියන්න :——————.

12. ඔබගේ සේවා කාලය තුළ කිසියම් අවස්ථාවක ඔබට විරුද්ධව විනය දඬුවමක් (අවවාද කිරීමක් හැර) පනවා ඇත් ද ? එසේ නම් විස්තර ලියන්න :——————.

13. 2010.07.31 වැනි දිනට පූර්වාසන්න පස් වසර තුළ ඔබ වැටුප් රහිත නිවාඩු ලබා තිබේ ද? ලබා තිබේ නම් විස්තර ලියන්න :——————.

14. .................................................................................................. වන මා විසින් මෙම අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය යැයි සොයා ගනු ලැබුවහොත් බස්නාහිර පළාත් අභ්‍යන්තර විගණන අංශයේ අධ්‍යක්ෂ තනතුර සඳහා වූ මාගේ හිමිකම නොසලකා හරිනු ලැබීමට ද මට විරුද්ධව විනයානුකූලව කටයුතු කරනු ලැබීමට ද හැකි බව මම හොඳාකාරවම දනිමි.

——————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————.

*ආයතන ප්‍රධානියාගේ සහතිකය*

ඉහත අයදුම්පත්‍රය ඉදිරිපත් කරන .................................................................................................................................... මයා./මිය./මෙනවිය

මෙම කාර්යාලයේ ............................................................................ සේවයේ නිලධාරියෙකු/නිලධාරිනියක බවත්, මා ඉදිරිපිට දී ...................................................... දින ඉහත
(තනතුර හා ශ්‍රේණිය)
අත්සන තැබූ බවත් සහතික කරමි.

——————,
ආයතන ප්‍රධානියාගේ අත්සන
(නිල මුද්‍රාව තබන්න)

දිනය :——————.

*අමාත්‍යාංශ ලේකම්ගේ/දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය*

.............................................................................................. මයා./මිය./මෙනවිය ............................................................. ලෙස දැනට මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ
(තනතුර හා ශ්‍රේණිය)
සේවය කරන බවත්, පෞද්ගලික ලිපිගොනුව අනුව අයදුම්පතෙහි සඳහන් කර ඇති තොරතුරු නිවැරදි බවත්, ඔහුගේ/ඇයගේ සේවය සතුටුදායක බව ද මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරින් නිදහස් කළ හැකි/නිදහස් කළ නොහැකි බව නිර්දේශ කරමි.

——————,
අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන හා නිල මුද්‍රාව.

දිනය :——————.

07-308

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.